# විධායක සංක්ෂිප්තය

**සංවර්ධන පසුබිම**

පසුගිය වසර **30** තුළ සාමාන්‍ය වශයෙන් **5%** කට වැඩි වර්ධන අනුපාතයක් අත්පත් කරගෙන, මධ්‍යම ආදායම් රටක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය වෙමින් සිටී. දිළිඳුකම අඩු කිරීමේ සහස්‍රවර්ෂ සංවර්ධන ඉලක්කය සපුරාලීමට රට නිසි මාර්ගයක ගමන් කරන බවට කිව හැක. එක හා සමාන ආදායම් මට්ටමක සිටින සෙසු රටවල් සමග සන්සන්දනය කිරීමේ දී, ශ්‍රී ලංකාවේ සමාජ දර්ශකයන් ඉතා උසස් මට්ටමක පවතින හෙයින්, සෙසු සහස්‍රවර්ෂ සංවර්ධන ඉලක්කයන් බොහොමයක් සපුරාලීමට ද හැකිවනු ඇතැයි බලාපොරොත්තු විය හැක.. කෙසේ වෙතත්, 1983 දී හටගත් සිවිල් ගැටුම රටේ ශක්‍යතාවය මුළුමනින්ම යොදා ගැනීමට බාධාවක් වී ඇත. රටේ පවතින ප්‍රබල මානව සම්පත් අඩිතාලම සහ නම්‍යශීලී පුද්ගලික අංශය ගත් විට, මෙම ශක්‍යතාවය ඉහළ මටටමක පවතින බව පෙනී යයි. නමුත්, පළාත් අතර ආදායම් වල අසමානතා විශාල පරතරයක් පෙන්නුම් කරන අතර විශේෂයෙන්ම මෙම ගැටුම් උතුර හා නැගෙනහිර පළාත් පසුබෑමට තුඩු දී ඇත. දිළිඳුකම තව දුරටත් අඩු කිරීමට කඩිනම් හා සාධාරණ ලෙස බෙදා යන සංවර්ධනය ඉතා අවශ්‍ය වනු ඇත. යටිතල පහසුකම් වල පවතින තියුණු අඩුපාඩුකම් සහ ආර්ථිකයේ ප්‍රධාන අංශවල දුර්වල ඵලදායිතාවය වර්ධනයට ප්‍රධාන බාධාවන් බවට පත්ව ඇත.

**රජයේ සංවර්ධන මූලෝපාය**

සියලු ජන කොටස් වලට ප්‍රතිලාභ ලබා දෙමින් රට සමාජ සංවර්ධනය කරා යොමු කරන කඩිනම් ආර්ථික වර්ධනයක් ලබා ගැනීම රජයේ 10 වසර සංවර්ධන රාමුවේ පරමාර්ථය වේ. මෙම සැලැස්ම සාධාරණාත්මක වර්ධනය අවධාරණය කරයි. මෙම ඉලක්කය කරා යාම සඳහා විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති ශ්‍රී ලංකාවේ නගර මධ්‍යස්ථාන සහ ගෝලීය වෙළඳපොලවල් සමග ගම්මාන බද්ද කරන ව්‍යාපෘති මෙන්ම ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර තරගකාරිත්වය වැඩි කිරීමේ ක්‍රියාමාර්ග වල සංයුතියක් මත රජය අවධානය යොමු කරයි. ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ඉලක්කයන් 10 වසර සංවර්ධන රාමුව මගින් පිහිටුවා ඇත. මෙම ඉලක්කයන් අත්පත් කරගැනීමෙහිලා පුද්ගලික ක්ෂේත්‍රය ප්‍රධාන කාර්යභාරයක් දරන අතර රජය සුදුසු වාතාවරණයක් ඇති කර දෙයි. රාජ්‍ය අංශයේ ව්‍යවසායයන්වල ක්‍රියා සාධනය ඉහල නැංවීමේ සාධකයක් වශයෙන් පුද්ගලීකරණය ප්‍රතික්ෂේප කර කළමනාකරණ ක්‍රියාකාරිත්වය යාවත් කිරීම තුළින් වඩාත් යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට රජය උත්සාහ දරයි.

**ආසියානු සංවර්ධන බැංකුවේ සංවර්ධන මූලෝපාය**

2009 – 2011 සඳහාවූ යෝජිත රට හවුල්කාර මූලෝපාය ආසියානු සංවර්ධන බැංකුව මගින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලබන ණය ආධාර සැපයීම සහ තාක්ෂණික ආධාර වැඩසටහන ඉදිරියට රැගෙන යයි. රට මුහුණ දෙන සංවර්ධන අභියෝග පිළිබඳ ස්වාධීන ඇගයීමක්, ආසියානු සංවර්ධන බැංකුවේ මූලෝපාය ප්‍රමුඛතාවයන් සහ රට පිළිබඳ නිපුණතාවය මෙන්ම රජයේ සංවර්ධන න්‍යාය පත්‍රය ආදී පදනම් කරගෙන 10 වසර

සංවර්ධන රාමුව යටතේ හඳුනා ගත් පහත සඳහන් ප්‍රධාන කුළුණු කෙරෙහි ආසියානු සංවර්ධන බැංකුව අවධානය යොමු කරයි: (i) ආයෝජනය සඳහා වූ වාතාවරණය වැඩි දියුණු කිරීම, සහ (ii) සමාජයේ සියලුම කොටස් ආවරණය වන පරිදි සංවර්ධනය අත්පත් කර ගැනීම. (iii) හැකියාවන් ගොඩනැංවීමට නව ප්‍රවේශයක් ඉදිරිපත් කිරීම ඇතුලුව පාලනය සහ ආයෝජන පරිසරය වැඩි දියුණු කිරීම තුලින් පුද්ගලික අංශය වර්ධනය කිරීම රට හවුල්කාර උපාය හරහා දිවෙන ප්‍රධාන කුළුණු දෙක වනු ඇත. වඩාත් කඩිනම් සහ සාධාරණත්වය පදනම් කරගත් වර්ධනය ගැටුම නිරාකරණය කර ගැනීමට උපකාරී වන නමුත්, ගැටුමේ ප්‍රධාන කාරණය සංවර්ධනය සහ දිළිඳුකම ඉක්මවා යයි. කෙසේවෙතත්, වඩාත් කඩිනම් සහ සාධාරණ වර්ධනයට සහාය වන ආසියානු සංවර්ධන බැංකුව මගින් ලබා දෙන ලද ආධාර ගැටුම් හේතුවෙන් ඇතිවන කම්පනය අවම කිරීමට ද උපකාරී වේ.

ආයෝජනය සඳහාවූ පරිසරය ශක්තිමත් කිරීමේ පළමු කුළුණ යටතේ, දුර්වල යටිතල පහසුකම් සහ ඉක්මණින් වෙනස් විය හැකි සාර්ව ආර්ථික පරිසරය වැනි ප්‍රධාන ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම තුලින් පුද්ගලික අංශයේ තරගකාරීත්වය වැඩි කර පුද්ගලික අංශය මගින් කරන ලබන ආයෝජන ප්‍රමාණය වැඩි කිරීමට ආසියානු සංවර්ධන බැකුව බලාපොරොත්තු වෙයි. (i) (විධිමත් වියදම් කළමනාකරණය, වඩාත් යහපත් බදු පරිපාලනය තුලින්) සාර්ව ආර්ථික කළමනාකරණය වැඩි දියුණු කිරීම (ii) රාජ්‍ය අංශ – පුද්ගලික අංශ හවුල්කාරකම් සම්බන්ධයෙන් පුද්ගලික ක්‍ෂේත්‍ර ආයෝජන සඳහා පාලන රාමුවක් ඉදිරිපත් කිරීම සහ (iii) බොහෝ වැදගත් කරුණක් ලෙස ආර්ථික යටිතල පහසුකම් සඳහා වූ විධිවිධාන වැඩි කිරීම යනාදිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව ආධාර ලබා දෙයි. පුද්ගලික අංශයේ ආයෝජන අවශ්‍යතාවයන් උත්ප්‍රේරණය කිරීමට රාජ්‍ය අංශය ශක්තිමත් කළ යුතුව තිබේ. එම නිසා, රාජ්‍ය අංශයේ දැඩි ලෙස ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම, රජයට අයත් ව්‍යවසායයන්වල සහ බැංකුවල කාර්යක්‍ෂමතාවය ඉහළ නැංවීම සහ කළහැකි අවස්ථාවල රාජ්‍ය – පුද්ගලික හවුල්කාරකම් ක්‍රියාත්මක කිරීම ඔස්සේ වඩාත් යහපත් කළමනාකරණයට ආසියානු සංවර්ධන බැංකු ආධාර මගින් මග පාදනු ඇත. ශ්‍රී ලංකාව ලබා ඇති අත්දැකීම් අනුව, රාජ්‍ය – පුද්ගලික අංශ හවුල්කාරකම් රාජ්‍ය අංශයේ කාර්යක්‍ෂමතාවය වැඩි දියුණු කිරීමට ප්‍රයෝජනවත් සාධකයක් ලෙස සැලකිය හැක. ප්‍රවාහන හා බලශක්ති ක්‍ෂේත්‍රයන්හි වැඩි වශයෙන් පුද්ගලික අංශ ආයෝජනය ලබා ගැනීම සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම ආසියානු සංවර්ධන බැංකු ආධාර තුලින් අනුග්‍රහය ලැබෙන ප්‍රධාන ඉලක්කයන් වේ. (යටිතල පහසුකම් වලට පමණක් අවධානය සීමා නොකර උදාහරණයක් වශයෙන් බලශක්ති සහ ජලය අපතේ යාම මෙන්ම රාජ්‍ය අංශ ව්‍යවසායයන්වල කාර්යමක්‍ෂතාවය වැඩි දියුණු කිරීම ද මෙයට ඇතුලත් වේ).

සමාජයේ සියලුම කොටස් වලට ප්‍රතිලාභ ලැබෙන පරිදි සංවර්ධනය ඇති කිරීමේ දෙවැනි කුළුණ යටතේ, ජල සම්පාදනය, බල ශක්ති සහ ප්‍රවාහන වැනි අංශවල උසස් තත්වයේ සේවාවන්

ලබා ගැනීමේ ප්‍රවේශය දුෂ්කර ප්‍රදේශවලට වැඩි කර අධ්‍යාපනය වැඩි දියුණු කිරීමට ආසියානු සංවර්ධන බැංකුව බලාපොරොත්තු වෙයි. හැකි නම් විමධ්‍යගත සේවා පහසුකම් හඳුන්වාදීමට වැඩි අවධානය යොමු කෙරේ. ඉලක්ක කරගත් ආධාර, දිළිඳු පවුල් බල ශක්ති සහ ජල සම්පාදන ක්‍රම වලට සම්බන්ධ වීමට උපකාරී වෙයි. අධ්‍යාපනය සඳහා ලබා දෙන ආධාර තුළින් ඉතාමත් දිළිඳු දිස්ත්‍රික්කවල විශිෂ්ඨ පාසැල් පිහිටුවීමට සහ දිළිඳු ළමුන්ට දීමනාවක් ලබා දීමට හැකිවනු ඇත. ව්‍යාපෘති සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීමේ දී සමාජය හවුල් කර ගැනීම රජයේ වගකීම තහවුරු කර දිළිඳුන්ට හඬක් ලබා දෙයි.

පාශ්වාත් ගැටුම් සහ ගැටුම් වලින් හානියකට පත් ප්‍රදේශවල ව්‍යාපෘති සම්බන්ධයෙන් ගැටුම් සංවේදී ප්‍රවේශයක් ආසියානු සංවර්ධන බැංකුව මගින් අනුගමනය කරනු ලැබේ. හවුල් කරුවන් සමග මනා ලෙස සාකච්ඡා කිරීම සහ ආසියානු සංවර්ධන බැංකුවේ අභ්‍යන්තර ක්‍රියාකාරි මූල ධර්මයන් පිළිපැදීම එම ප්‍රවේශයට අයත් වේ.

**ක්ෂේත්‍රයන්**: බලශක්ති, නීති, ආර්ථික කළමනාකරණය සහ ප්‍රසිද්ධ ප්‍රතිපත්ති; ප්‍රවාහන සහ සන්නිවේදන; ජල සම්පාදන සහ සනීපාරක්ෂාව, අධ්‍යාපනය[1] . තේමාවන්: තිරසාර ආර්ථික වර්ධනය; පුද්ගලික අංශ වර්ධනය; පාලනය.

[1] උපග්‍රන්ථය 5 මගින් ක්ෂේත්‍ර මාර්ග සිතියම ඉදිරිපත් කර ඇත.

**එක් එක් අංශය වශයෙන් ලැබුනු මුදල් වෙන් කිරීම**

ප්‍රතීයමාන සංඛ්‍යාංක : $ මිලියන 100 – $ මිලියන 110 වාර්ෂිකව ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත්වලින්; $ මිලියන 100 - $ 120 මිලියන වාර්ෂිකව ආසියානු සංවර්ධන බැංකුවේ ආසියානු සංවර්ධන අරමුදලින්; සහ $ මිලියන 3 –$ මිලියන 4 ක් ව්‍යාපෘති පිළියෙල කිරීම සහ උපදේශක සහය සඳහා වූ ප්‍රතිපාදන වලින්. ඉලක්ක කර ගත් මුළු ප්‍රතීයමාන සම්පත් වෙන්කිරීම වසරකට ඩොලර් මිලියන 300 ක් වන අතර රාජ්‍ය – පුද්ගලික අංශ හවුල්කාරකම් සහ පුද්ගලික රාජ්‍ය අංශ ණය වලින් සම මූල්‍ය මුදල් ලබා ගැනීමට ආසියානු සංවර්ධන බැංකුව සහ රජය බලාපොරොත්තු වේ.

**හවුල්කාර විධිවිධාන**

ශ්‍රී ලංකා සංවර්ධන හවුල්කරු අතර සෘජු සහයෝගිතා ක්‍රමයක් දැන් පැවැත්වේ. ප්‍රධාන සංවර්ධන හවුල්කරු රැස්වීම ද්විමාසිකව පවත්වන අතර වටමාරු ක්‍රමයට ආසියානු සංවර්ධන බැංකුව, යුරෝපා සංගමය, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ලෝක බැංකුව රැස්වීමට මූලසුන දරයි. වර්තමානයේ ආසියානු සංවර්ධනය බැංකුව මූලසුන හොබවයි. ප්‍රධාන කණ්ඩායම යටතේ උප කණ්ඩායම් කිහිපයක්ද තේමාවන් යටතේ වූ අනියම් උප කණ්ඩායම් ද ක්‍රියාත්මක වේ. උපදෙස් සාකච්ඡා, සම මුදල් යෙදවීම් සහ දැනුම බෙදාගැනීම තුළින් ශ්‍රී ලංකාවේ සෙසු සංවර්ධන හවුල්කරු සමග ආසියානු සංවර්ධන බැංකුව ඉතා සමීපව නොකඩවා කටයුතු කරයි.

ගැටුමට අමතරව, අධික ලෝක තෙල් මිළ සහ තියුණු උද්දමනය හේතුවෙන් ඇතිවන කම්පනය නිසා වාර්ය ආර්ථික අවනිශ්තතාවයන් සහ අවධානම් තත්වයන් වැඩි වී ඇත. මෙම අවධානම් තත්වයන් අවම කිරීම පිණිස, (ආදායම් ඉහළ නැංවීම සහ විදයම් විධිමත් කිරීම තුළින්) සම්පත් ජංගනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සහය වෙයි.. එමගින් උද්දමන තෙරපුම වකුව පහත වැටී වෙළඳ පරතරය අඩු කර ගැනීමට ශ්‍රී ලංකාවේ ආර්ථිකය සහ ගෝලීය ආර්ථිකය අතර පවතින සම්බන්ධතා පුළුල් වේ.

## සටහන A6.2: ණය නොවන නිෂ්පාදන සහ සේවාවන් සඳහා වූ ප්‍රතියමාන ආධාර නල මග 2009–2011

| ක්ෂේත්‍ර ආධාර නම | වගකිව යුතු අංශය | ආධාරයේ වර්ගයa | අරමුදල් වල ප්‍රභවයන් – ආසියානු සංවර්ධන බැංකුව – ප්‍රභවb | ආසියානු සංවර්ධන බැංකුව – ගණන ($'000) | සෙසු – ප්‍රභවc | සෙසු – ගණන ($'000) | එකතුව ($'000) |
|---|---|---|---|---|---|---|---|
| **2009** | | | | | | | |
| **නීතිය, ආර්ථික කළමනාකරණය සහ ප්‍රසිද්ධ ප්‍රතිපත්ති** | | | | | | | |
| 1. තාක්ෂණික සහය ආධාර හැකියා වර්ධන අරමුදල. | SLRM | ADTA | | 2,000.00 | | 0.00 | 2,000.00 |
| 2. නාගරික පලාත් සභාවල හැකියාව වර්ධනය කිරීම සඳහා වූ ආධාර | SAUD | ADTA | | 800.00 | | 0.00 | 800.00 |
| **අනු එකුව** | | | | **2,800.00** | | **0.00** | **2,800.00** |
| **ප්‍රවාහන හා සන්නිවේදන** | | | | | | | |
| 2. බහු ප්‍රවාහන ක්‍රම අධ්‍යනයය | SATC | ADTA | | 1,000.00 | | 0.00 | 1,000.00 |
| **අනු එකතුව** | | | | **1,000.00** | | **0.00** | **1,000.00** |
| **බලශක්ති** | | | | | | | |
| 3. තිරසාර බලශක්ති II | SAEN | PPTA | | 800.00 | | 0.00 | 800.00 |
| **අනු එකතුව** | | | | **800.00** | | **0.00** | **800.00** |
| **එකතුව** | | | | **4,600.00** | | **0.00** | **4,600.00** |
| **2010** | | | | | | | |
| **ප්‍රවාහන හා සන්නිවේදන** | | | | | | | |
| 1. ජාතික හා පලාත් මාර්ග | SATC | PPTA | | 1,000.00 | | 0.00 | 1,000.00 |
| 2. බහු ප්‍රවාහන ක්‍රම අධ්‍යයනය | SATC | PPTA | | 1,000.00 | | 0.00 | 1,000.00 |
| **අනු එකතුව** | | | | **2,000.00** | | **0.00** | **2,000.00** |
| **නීතිය, ආර්ථික කළමනාකරණය සහ ප්‍රසිද්ධ ප්‍රතිපත්ති** | | | | | | | |
| 3. ප්‍රසිද්ධ මූල්‍ය කළමනාකරණය | SAGF | PPTA | | 1,000.00 | | 0.00 | 1,000.00 |
| **අනු එකතුව** | | | | **1,000.00** | | **0.00** | **1,000.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **ජල සම්පාදනය, සනීපාරක්‍ෂාව සහ අපද්‍රව්‍ය කළමනාකරණය** | | | | | |
| 4. නාගරික පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (ද්විතියික නගර) | SAUD | PPTA | 800.00 | 0.00 | 800.00 |
| **අනු එකතුව** | | | **800.00** | **0.00** | **800.00** |
| **අධ්‍යාපනය** | | | | | |
| 5. ජාතික අධ්‍යාපන ක්ෂේත්‍ර ව්‍යාපෘතිය | SANS | PPTA | 800.00 | 0.00 | 800.00 |
| **අනු එකතුව** | | | **800.00** | **0.00** | **800.00** |
| **2011** | | | | | |
| **නීතිය, ආර්ථික කළමනාකරණය සහ ප්‍රසිද්ධ ප්‍රතිපත්ති** | | | | | |
| 1. තාක්‍ෂණික සහය ආධාර හැකියා වර්ධන අරමුදල. II | SLRM | ADTA | 2,000.00 | 0.00 | 2,000.00 |
| **අනු එකතුව** | | | **2,000.00** | 0.00 | **2,000.00** |
| **ජල සම්පාදනය, සනීපාරක්‍ෂාව සහ අපද්‍රව්‍ය කළමනාකරණය** | | | | | |
| 2. නාගරික පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (ද්විතියික නගර) | SAUD | PPTA | 1,000.00 | 0.00 | 1,000.00 |
| **අනු එකතුව** | | | **1,000.00** | **0.00** | **1,000.00** |
| **එකතුව** | | | **3,000.00** | **0.00** | **3,000.00** |

**ADB=**ආසියානු සංවර්ධන බැංකුව, ADTA=උපදේශක තාක්‍ෂණික ආධාර, PPTA= ව්‍යාපෘති සැකසීමේ තාක්‍ෂණික ආධාර
මූලාශ්‍රය: ආසියානු සංවර්ධන බැංකු ඇස්තමේන්තු